සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ආර්ථික විද්‍යාව - I

**13 ශ්‍රේණිය**

**කාලය පැය 02 යි.**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) නිෂ්පාදන සම්පත්වල 'සජීවී සම්පත්' අර්ථ දක්වා ඇත්තේ කුමන ප්‍රකාශනය මගින්ද?

(1) භූමිය හා එහි අන්තර්ගත සියලුම සම්පත්ය.
(2) නිෂ්පාදනයට සීමා සහිත සැපයුමක් ලබාදෙන සම්පත්ය.
(3) නිෂ්පාදනයට අසීමිත සැපයුමක් ඇති සම්පත්ය.
(4) නිෂ්පාදනයට යොදාගනු ලබන භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය යන සම්පත්ය.
(5) නිෂ්පාදනයේදී නැවත ප්‍රතිජනනය වන ස්වභාවික සම්පත්ය. (........)

(02) පරිභෝජනය හා ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය කරන ආර්ථිකයක ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය වැඩිකිරීමේදී ආවස්ථික පිරිවැය නිවැරදිව ප්‍රකාශ වන්නේ කුමන පිළිතුර මගින්ද?

(1) පරිභෝජන භාණ්ඩ නිමවුම අඩුවීමයි. (2) පරිභෝජන භාණ්ඩ නිමවුම වැඩිවීමයි.
(3) ජාතික නිමවුම පහළ යාමයි. (4) භාණ්ඩ දෙවර්ගයම සමානව අඩුවීමයි.
(5) ආයෝජන හා ඉතිරිකිරීම් අඩුවීමයි. (........)

(03) ආර්ථික භාණ්ඩවල දැකිය හැකි ලක්ෂණයකි.

(1) ආවස්ථික පිරිවැය ශුන්‍ය වීම. (2) ආවස්ථික පිරිවැයක් හටගැනීම.
(3) වෙළඳපළේ හුවමාරු නොවේ. (4) සැපයුම් අසීමිත වීම.
(5) ඉහත සාධක සියල්ලම දැකිය හැක. (........)

(04) ඕනෑම සමාජයකට මුහුණ පෑමට ඇති ප්‍රධාන ආර්ථික ප්‍රශ්නයකි.

(1) ස්වභාවික සම්පත් හායනය වීමේ ගැටළුව
(2) තාක්ෂණික ශිල්පීය ක්‍රම භාවිතය පිළිබඳ ගැටළුව
(3) මිනිස් වුවමනාවලට සාපේක්ෂ සම්පත් සීමාසහිත වීමේ ගැටළුව
(4) ස්වභාවික සම්පත් අධි උපයෝජනය පිළිබඳ ගැටළුව
(5) සමහර සම්පත් ප්‍රතිස්ථාපනය කළ නොහැකිවීමේ ගැටළුව (........)

(05) "නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව" නිවැරදිව ප්‍රකාශ වන්නේ කවර ප්‍රකාශය මගින්ද?

(1) සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාව ප්‍රශස්ථ ලෙස සිදු වූ බවකි.
(2) එක් භාණ්ඩයක නිමවුම වැඩිකොට අනෙක් භාණ්ඩයේ නිමවුම අඩුකළ බවකි.
(3) නිෂ්පාදන හැකියා මායිමෙන් දකුණට නිෂ්පාදනය වැඩි වූබවකි.
(4) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයෙන් වමට නිමවුමක් නිෂ්පාදනය කරන බවයි.
(5) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත පිහිටි ලක්ෂයක නිෂ්පාදනය කරන බවකි. (........)

(06) "මානව සම්පත" වැඩි දියුණු කිරීමේලා බලපානු ලබන්නේ,

(1) පරිගණක ආයතන රට පුරා ව්‍යාප්ත කිරීම.

(2) සියළුම රජයේ පාසල්වලට තාක්ෂණික විෂයධාරාව ලබාදීම.

(3) විදේශ පුහුණුකිරීම් සහා මානව සම්පත යොමු කිරීම.

(4) ශ්‍රමය පුහුණු කිරීමට පෞද්ගලික අංශයට යොමු කිරීම.

(5) අධ්‍යාපනය නැංවීම හා පුහුණු කිරීම්, තාක්ෂණික දැනුම හා නිපුනතා සංවර්ධන ක්‍රියාවලීන් වැඩි කිරීම මගිනි. (........)

(07) නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනෙන පහත සඳහන් සම්පත් වලින් නැවත නැවතත් ප්‍රතිජනනය වන සම්පත් වන්නේ,

(1) ගල් අඟුරු හා ඛණිජ සම්පත්

(2) ඛණිජ තෙල් හා මත්ස්‍ය සම්පත්

(3) වන සම්පත් හා මත්ස්‍ය සම්පත්

(4) වන සම්පත් හා ඛණිජ තෙල්

(5) ජලය හා ඛණිජතෙල් (........)

(08) ශ්‍රී ලංකා ආර්ථිකය තුළ මිනිස් වුවමනා ඉටුකර ගැනීමට යාමේදී "සම්පත් වල හිඟකම" ගැටළුවක් වුවද ඕස්ට්‍රේලියාව වැනි රටවල වුවමනා ඉටුකර ගැනීමේදී එය ගැටළුවක් නොවුන බවයි. මින් පැහැදිලි වන්නේ,

(1) ඕස්ට්‍රේලියාවට සම්පත් හිඟකමක් නොමැති බවකි.

(2) සම්පත්වල හිඟකමක් ඇති නමුත් වැඩි දියුණු කරන ලද තාක්ෂණය මගින් නම්පත්වල ඵලදායිතාව ඉහළ නංවා ඇති බවකි.

(3) ඕස්ට්‍රේලියාව විශාල රටක් බැවින් ශ්‍රී ලංකාවේ සම්පත් හිඟයක් ඇති බවයි.

(4) ශ්‍රී ලාංකිකයන්ගේ මිනිස් වුවමනා ඕස්ට්‍රේලියාවට සාපේක්ෂව වැඩි බවයි.

(5) ඕස්ට්‍රේලියාවේ ජනගහනය ශ්‍රී ලංකාවට වඩා අඩු බවයි. (........)

(09) වෙළඳපල ආර්ථික පද්ධතියක (පෞ. ව්‍යවසායකත්ව) දක්නට ලැබෙන ප්‍රධානතම ලක්ෂණයකි,

(1) ශ්‍රමය හා සියළුම දේපල සම්පත් රජය සතුවීම.

(2) සම්පත්වල හිමිකාරත්වය පෞද්ගලික අංශය සතුවීම.

(3) සම්පත් හා දේපල පෞද්ගලික හා රාජ්‍ය යන අංශ යටතේ පාලනය වීම.

(4) මධ්‍යගත සැලසුම් යාන්ත්‍රණය මගින් මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම.

(5) සමාජ ශුභ සාධනය මූලික කොට භාණ්ඩ හා සේවා නිෂ්පාදනය (........)

(10) මිනිස් වුවමනා ඉටුකරන අමිල භාණ්ඩවල දැකිය හැකි ලක්ෂණයකි.

(1) සම්පත් පිරිවැයක් තිබීම.

(2) ආවස්ථික පිරිවැය හටගැනීම.

(3) සාධක සංයෝග කර නිපදවීම.

(4) ස්වභාව ධර්මයා අසීමිතව සැපයීම.

(5) සීමා සහිත සැපයුමක් තිබීම. (........)

(11) "විධාන ආර්ථික ක්‍රමයක" කුමක් නිෂ්පාදනය කළ යුතුද? යන මූලික ආර්ථික ප්‍රශ්නය විසඳනු ලබන්නේ,

(1) ස්වර්ථය පදනම් කරගෙනය.

(2) මිල යාන්ත්‍රණය ලබාදෙන නියෝග මතය.

(3) පාරිභෝගික ඉල්ලුම හා සැපයුම අනුවය.

(4) පාරිභෝගිකයාගේ ක්‍රය ශක්තිය අනුවය.

(5) රජය මගින් ලබාදෙන නියෝග අනුවය. (........)

(12) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් 'වමට විතැන්වීම' සඳහා හේතු විය හැකි සාධකයකි.

(1) යෙදවුම්වල ඵලදායිතාව ඉහළ යාම.

(2) නිෂ්පාදන ශිල්පීය ක්‍රමවල වැඩි දියුණුවීම.

(3) ආර්ථිකය නව සම්පත් සොයා ගැනීම.

(4) ආර්ථික සම්බාධක පැනවීම.

(5) සේවා නියුක්තියේ ඉහළයාම. (........)

(13) වෙළඳපල ආර්ථිකයක ලාභය මගින් සිදුකරන කාර්යයක් වන්නේ,

(1) ආර්ථිකයේ ශුභසාධනයට සම්පත් බෙදාදීම.

(2) ආර්ථිකයේ සම්පත් බෙදීයාම කාර්යක්ෂම කිරීම.

(3) ආර්ථිකයේ පොදු භාණ්ඩ සඳහා සම්පත් බෙදා වෙන්කිරීම.

(4) නියාමනයන් සකස් කිරීමට අනුබල දීම.

(5) මිල ස්ථායිතාවය තහවුරු කිරීම. (........)

(14) භාණ්ඩයේ මිල හා සැපයුම් ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධතාවයක් ඇතිකිරීමට හේතුවන සාධකය කවරේද?

(1) සැපයුම්කරුගේ ලාභය (2) ආදේශන භාණ්ඩ මිල

(3) ඉල්ලුම්කරුගේ ආදායම (4) සැපයුම්කරුවන්ගේ අපේක්ෂාව

(5) ඉහත සාධක සියල්ලම (........)

(15) එක්තරා වෙළඳපලක අලෙවිකරන Z භාණ්ඩයේ ඉල්ලුම් වක්‍රය දකුණට විතැන්විය. මේ සඳහා බලපෑ හැකි නිවැරදි සාධකය වන්නේ,

(1) නිෂ්පාදන සාධක මිල අඩුවීම. (2) නිෂ්පාදන සාධක මිල වැඩිවීම.


(3) පාරිභෝගික ආදායම අඩුවීම. (4) පාරිභෝගික රුචිය වැඩිවීම.

(5) අනාගතයේ භාණ්ඩයේ මිල ඉහළ යන බවට අපේක්ෂාව (........)

(16) වෙළඳපලේ Y භාණ්ඩයේ මිල 10% කින් ඉහළ ගිය අතර, ඉල්ලුම 5% කින් අඩුවිය. Y භාණ්ඩය සම්බන්ධයෙන් ව්‍යාපාරික අයභාරය වැඩිවිය හැක්කේ,

(1) 3% (2) 5% (3) 5.5% (4) 6.5% (5) 4.5% (........)

(17) වෙළඳපලේ X භාණ්ඩය සඳහා සමතුලිත මිලක් තීරණය වී ඇති අතර X භාණ්ඩය සඳහා රජය රු. 500 බද්දක් පැනවීමෙන් පසු සැපයුම් වක්‍රය $S_2$ ලෙස විතැන් වී ඇත. බද්දෙන් පසු අහිමි වන පාරිභෝගික අතිරික්තය වන්නේ,




(1) D + F + M (2) E + G + C

(3) A + B + H (4) A + B + C + D

(5) B + C + D (........)

(18) රජය මගින් 'දුම්පානය' වැළැක්වීම සඳහා දුම්කොළ මත දේශීය ඉද්දක් පනවන ලදී. බද්දෙන් පසු සිගරට් එකක මිල 25% කින් ඉහළ ගිය අතර අවු. 40 වැඩි පුරුෂ පාර්ශවයේ පරිභෝජනය 20% කින් අඩු වූ බවත්, තරුණ පාර්ශවයේ පරිභෝජනය 40% කින් අඩු වූ බවත් අනාවරණය විය. මෙයින් පැහැදිලි වන්නේ,

(1) අවු. 40 ට වැඩි පිරිසට අනම්‍ය වූ අතර තරුණ පිරිසට නම්‍ය භාණ්ඩයක් වී ඇති බවකි.

(2) අවු. 40 ට වැඩි පිරිසට මෙන්ම තරුණ පිරිසටද අනම්‍ය භාණ්ඩයක් වී ඇති බවකි.

(3) අවු. 40 ට වැඩි පිරිසට මෙන්ම තරුණ පිරිසටද නම්‍ය භාණ්ඩයක් වී ඇති බවකි.

(4) සිගරට් මිල වැඩිවීමට සාපේක්ෂව වැඩි ප්‍රමාණයකින් ඉල්ලුම කපාහැර ඇති බවකි.

(5) සිගරට් මිල වැඩිවීමට සාපේක්ෂව ඊට වඩා අඩු ප්‍රමාණයකින් ඉල්ලුම කපා හැර ඇති බවකි. (........)

(19) පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක A භාණ්ඩය සම්බන්ධව මුළු පිරිවැය (TC) මුළු අයභාරයට (TR) සමානවීමෙන් ගම්‍ය වන්නේ,

(1) ආර්ථික අලාභ ලබන මට්ටමක ආයතනය කටයුතු කරන බව
(2) ආර්ථික ලාභ උපරිමනය කරන නිෂ්පාදන මට්ටමක කටයුතු කරන බව
(3) ආයතනයට විචල්‍ය පිරිවැය පියවාගත නොහැකි මට්ටමක සිට කටයුතු කරන බව
(4) ප්‍රාමාණික ලාභ ලබන මට්ටමක ආයතනය කටයුතු කරන බව
(5) ආර්ථික ලාභ උපයමින් ආයතනය නිෂ්පාදන කටයුතු කරන බව (........)

(20) නිෂ්පාදන න්‍යායට අනුව දිගු කාලය අර්ථ දක්වා ඇත්තේ,

(1) ස්ථාවර යෙදවුම් වෙනස්කළ නොහැකි කාලයයි.
(2) සියළුම සාධක විචල්‍ය සාධක බවට පත්කළ හැකි කාලයයි.
(3) ස්ථාවර හා විචල්‍ය යන සාධක වෙනස් කළ නොහැකි කාලයයි.
(4) විචල්‍ය සාධක පමණක් වෙනස් කළ නොහැකි කාලයයි.
(5) හීනවන ඵලදා න්‍යාය ක්‍රියාත්මක වන කාලයයි. (........)

(21) දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේදී සාමාන්‍ය පිරිවැය වක්‍රයේ ඉහළට ගමන් කරන ප්‍රදේශයෙන් පැහැදිලි වන්නේ,

(1) පරමාණුකූල පිරිවැසුම්
(2) ස්ථාවර පරමාණුකූල ඵල
(3) අඩුවන ආන්තික පිරිවැය
(4) පරමාණුකූල නොපිරිමැසුම්
(5) වැඩිවන පරමාණුකූල ඵල (........)

(22) කෙටිකාලීන නිෂ්පාදන ආයතනයක හීනවන ඵලදා න්‍යාය වඩාත් හොඳින් පැහැදිලි වන්නේ මින් කවර ප්‍රකාශය මගින්ද,

(1) ස්ථාවර සාධක වැඩිකරමින් විචල්‍ය සාධක සමඟ සංයෝග කිරීමෙන් ආන්තික නිමවුම වැඩිවේ. ආන්තික පිරිවැය ද වැඩි වේ.
(2) ස්ථාවර සාධක හා විචල්‍ය සාධක සමානව සංයෝග කළ විට මුළු ඵලදාව ක්‍රමයෙන් ඉහළට ගමන් කර පසුව ක්‍රමයෙන් අඩු වේ.
(3) ස්ථාවර සාධක හා විචල්‍ය සාධක එකතුකරමින් නිෂ්පාදනය කළ විට මුළු ඵලදාව හා මුලු පිරිවැය ඉහළ යයි.
(4) ස්ථාවර සාධක සමඟ විචල්‍ය සාධක වැඩි කළ විට මුළු ඵලදාව ඉහළ යන අතර ආන්තික ඵලදාව අඩුවේ.
(5) ස්ථාවර සාධක සමඟ විචල්‍ය යෙදවුම් වැඩි කළ විට මුළු ඵලදාව හා ආන්තික ඵලදාව එක්තරා අවස්ථාවකින් පසු පහල වැටෙන අතර ආන්තික පිරිවැය ක්‍රමයෙන් වැඩිවේ. (........)

(23) ඒකාධිකාරී වෙළඳපලක දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,

(1) සුවිශේෂිත භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතන විශාල සංඛ්‍යාවක් තිබීම.
(2) සමජාතීය භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතන විශාල සංඛ්‍යාවක් තිබීම.
(3) ප්‍රභේදනය වූ භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතන සුළු ප්‍රමාණයක් තිබීම.
(4) ප්‍රභේදනය වූ භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතන විශාල සංඛ්‍යාවක් තිබීම.
(5) සුවිශේෂිත වූ භාණ්ඩ නිෂ්පාදනය කරන ආයතන එකක් පමණක් තිබීම. (........)

The National e-learning Portal for The General Education

(24) පූර්ණ තරගකාරී නිෂ්පාදන ආයතනයක 'සැපයුම' ආරම්භ කරනු ලබන්නේ,
(1) භාණ්ඩයේ ස්ථාවර පිරිවැය ආවරණය වූ පසුවය.
(2) භාණ්ඩයේ අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැය ආවරණය වූ පසුවය.
(3) භාණ්ඩයේ සාමාන්‍ය මුළු පිරිවැය ආවරණය වූ පසුවය.
(4) භාණ්ඩයේ මුළු පිරිවැය ආවරණය වූ පසුවය.
(5) ආන්තික පිරිවැය වක්‍රයේ අවම අගය ආවරණය වූ පසුවය. (........)

(25) පහත සඳහන් වෙළඳ ව්‍යුහයන් අතුරෙන් 'මිල සකසන්නෙකු' වශයෙන් කටයුතු කරන වෙළඳපොලකි.
(1) පූර්ණ තරගකාරී වෙළඳපොල (2) ඒකාධිකාරී තරග වෙළඳපොල
(3) ඒකාධිකාරී වෙළඳපොල (4) කතිපයාධිකාරී වෙළඳපොල
(5) භාණ්ඩ හා සේවා වෙළඳපොල (........)

(26) දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ යෙදීසිටින නිෂ්පාදන ආයතනයක ක්‍රියාත්මක වන්නේ,
(1) හීනවන ඵලදායිතා නීතිය
(2) පරමාණුකූල ඵල නීතිය.
(3) ස්ථාවර යෙදවුම්වල කාර්යක්ෂමතාවයේ හීනවීම.
(4) විචල්‍ය සාධකවල නොපිරිවැසුම් හටගැනීම.
(5) මූල පිරිවැයේ පලදායිතාව වැඩිවීමේ නීතිය. (........)

(27) ව්‍යාපාර වක්‍රයක විභව නිමවුම හා සැබෑ නිමවුම අතර පරතරයකින් පැහැදිලි වන්නේ,
(1) නිමවුම් පරතරයක් ඇතිබවයි. (2) ආර්ථිකයේ පසුබැසීමක් සිදු වී ඇතිබවයි.
(3) ආර්ථිකයේ ප්‍රසාරණයක් සිදු වූ බවයි. (4) චක්‍රීය බසුබැසීමක් හටගෙන ඇති බවයි.
(5) ආර්ථිකයේ සැබෑ වර්ධනයක් හටගෙන ඇති බවයි. (........)

(28) පාරිභෝගිකයාගේ ආදායම ශුන්‍ය මට්ටමේදී හටගන්නා පරිභෝජනය හඳුන්වන්නේ,
(1) ස්වාධීන පරිභෝජනය වශයෙනි. (2) පෙළඹුන පරිභෝජනය වශයෙනි.
(3) ආන්තික පරිභෝජන හැකියාව වශයෙනි. (4) සාමාන්‍ය පරිභෝජන හැකියාව වශයෙනි.
(5) සාමාන්‍ය පරිභෝජනය වශයෙනි. (........)

(29) සාර්ව ආර්ථිකයක නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ උපයන සාධක ආදායම් වල අගය සමාන වන්නේ,
(1) ශුද්ධ ජාතික ආදායමට (2) දළ දේශීය නිෂ්පාදනයට
(3) දළ දේශීය වියදමට (4) ශුද්ධ වියදමට
(5) ශුද්ධ දේශීය නිෂ්පාදිතයට (........)

(30) සංවෘත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $c = 300 + 0.8\,yd$ නම් ආයෝජන ගුණකය වන්නේ,
(1) 5 (2) 0.5 (3) 1.15 (4) 2.5 (5) 0.55 (........)

(31) කල්පිත ආර්ථිකයක සපත්තු නිෂ්පාදනය සම්බන්ධව දත්ත පහත දැක්වේ. සම් සඳහා රු. මි. 2500, සායම් වර්ග රු. මි 500, ශ්‍රයට ගෙවූ වැටුප් රු.මි. 2500, යන්ත්‍ර උපකරණ ක්ෂය වීම් රු.මි. 1700, ගොඩනැගිලි බදු කුලිය රු. මි. 1800. සපත්තු කර්මාන්තය මගින් නිමවුමට එකතුවන වටිනාකම ආදායම් මූලාශ්‍ර ක්‍රමයට අනුව,
(1) රු.මි. 9000 (2) රු.මි. 6000 (3) රු.මි. 3000
(4) රු.මි. 4300 (5) රු.මි. 8500 (........)

(32) දළ දේශීය නිෂ්පාදනය මත කරන වියදම දැක්වෙන ප්‍රකාශය
(1) $y = C + I + G$ (2) $y = C + I + G + x - m$ (3) $y = C + I$
(4) $S + T = I + G$ (5) $S + T + M = I + G + x$ (........)

(33) ආවෘත ආර්ථිකයක පරිභෝජන ශ්‍රිතය $C = 300 + 0.75\ yd$ මට්ටමේදී ඉතිරිකිරීම් රු.මි. 200 විය. ආර්ථිකයේ ආදායම් මට්ටම වන්නේ,

(1) රු.මි. 2000 (2) රු.මි. 200 (3) රු.මි. 500
(4) රු.මි. 20000 (5) රු.මි. 2500 (........)

(34) භාණ්ඩ හුවමාරු ආර්ථිකයේ පැනනැගුණු ප්‍රධාන ගැටළුවක් ලෙස ප්‍රකාශ කළ හැක්කේ මින් කවර ප්‍රකාශයද?

(1) හඳුනාගැනීමේ අපහසුව (2) මිනුම් කිරීමේ අපහසුව
(3) වෙළෙඳපල පටුවීම. (4) වුමනාවන් එකිනෙකට නොගැලපීම.
(5) ශ්‍රමය බෙදීයාම පිළිබඳ ගැටළුව (........)

(35) උද්ධමනය ලෙස අර්ථ දක්වන්නේ,

(1) පොදු මිල මට්ටම්වල අඛණ්ඩ පහළ බැසීමයි.
(2) පොදු මිල මට්ටම්වල අඛණ්ඩ ඉහළ යාමයි.
(3) නව කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ පහළ යාමයි.
(4) නව කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ ජංගම වර්ෂයේ වැඩිවීමයි.
(5) මිල මට්ටම්වල සාමාන්‍ය ප්‍රතිශතයේ වැඩිවීමයි. (........)

(36) කල්පිත ආර්ථිකයක දළ දේශීය නිෂ්පාදිතය රු.මි. 6000 හා සාමාන්‍ය මිල මට්ටම ඒකක 8 මුදල් තොගය රු.මි. 3000 නම් ආර්ථිකයේ මුදල් සංසරණ ප්‍රවේගය,

(1) 8 (2) 4 (3) 12 (4) 16 (5) 20 (........)

(37) පුළුල් මුදල් සැපයුමේ ඇතුලත් වන ආසන්න මුදල් මින් කවරේද?

(1) කාලීන හා ඉතුරුම් තැන්පතු (2) කාලීන හා ඉල්ලුම් තැන්පතු
(3) කාසි හා නෝට්ටු (4) බැංකු සතු පදනම් මුදල්
(5) ඉතුරුම් හා ඉල්ලුම් තැන්පතු (........)

(38) ශ්‍රී ලංකා මහා බැංකුව වාණිජ බැංකු සමග ප්‍රති ගැණුම් ගිවිසුම් ඇතිකරගත් විට සිදුවන්නේ,

(1) වාණිජ බැංකුවල පවත්නා අතිරික්ත සංචිත මහ බැංකුව වෙත අවශෝෂණය වේ.
(2) මුදල් සැපයුම වැඩිවේ.
(3) වාණිජ බැංකුවල ඉල්ලුම් තැන්පතු වැඩිවේ.
(4) වාණිජ බැංකු සතු අධි සංචිත ඉහළ යයි.
(5) ක්ෂණික මුදල් වෙළෙඳපලේ පොලී අනුපාතය පහළ යයි. (........)

(39) ගෙවුම් ශේෂ ලේඛනයේ හිඟයක් පවතින විට මුල්‍ය බලධාරීන් ශ්‍රී ලංකා රුපියල 'අවප්‍රමාණය' කරන ලදී. මෙය ගෙවුම් ශේෂය කෙරේ ඇතිකර බලපෑම මින් කවරක් විය හැකිද?

(1) දේශීය රුපියල් සඳහා විදේශ ඉල්ලුම අඩුවේ.
(2) අපනයන සඳහා ඉල්ලුම ධෛයර්‍යමත් වීම හා අපනයන ආදායම ඉහළ යාම.
(3) විදේශ ආයෝජනයන් මෙරටට කරන ආයෝජනය පහල යාම.
(4) ආනයන වියදම් ඉහළ යාම.
(5) අපනයන ඉල්ලුම අධෛයර්‍යත් වීම හා අපනයන ආදායම පහළ යාම. (........)

(40) කොළඹ ආයෝජන ගෙවුම් ශේෂ ලේඛනයේ කුමන ගිණුමක ඇතුලත් කරනු ලැබේද?

(1) පෞද්ගලික සංග්‍රාම ගිණුම (2) වෙළඳ ගිණුම
(3) සේවා ගිණුම (4) ප්‍රාථමික ආදායම් ගිණුම
(5) මුල්‍ය ගිණුම (........)

(41) ආර්ථිකයේ මිල ස්ථායිතාවය පවත්වාගෙන යාම සඳහා යොදා ගනු ලබන ප්‍රතිපත්තිය වන්නේ,

(1) රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය (2) මූල්‍ය ප්‍රතිපත්තිය
(3) අයවැය ප්‍රතිපත්තිය (4) වියදම් පාලන ප්‍රතිපත්තිය
(5) විදේශ විනිමය ප්‍රතිපත්තිය (........)

(42) අවගුණ භාණ්ඩයක් වඩාත් හොඳින් පැහැදිලි වන්නේ කුමන ප්‍රකාශය මගින්ද?

(1) පරිභෝජනයේදී හා නිෂ්පාදනයේදී සමාජ ප්‍රතිලාභ අත්කරන භාණ්ඩ
(2) සමාජ ප්‍රතිලාභ පෞද්ගලික ප්‍රතිලාභවලට වඩා වැඩි භාණ්ඩ
(3) සමාජ ප්‍රතිලාභ පෞද්ගලික ප්‍රතිලාභ වලට වඩා අඩු භාණ්ඩ
(4) නිෂ්පාදනයේදී සමාජයට ඍණ බාහිරතා අත්කරන භාණ්ඩ
(5) පරිභෝජනයේදී පෞද්ගලික ප්‍රතිලාභ වැඩි භාණ්ඩ (........)

(43) සමාජ සාධාරණත්වය ඇතිකිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මගින් යොදාගනු ලබන ක්‍රියාවලියක් ලෙස දැක්විය හැක්කේ,

(1) බදු ක්‍රමය මගින් අනුක්‍රමික බදු හා රාජ්‍ය වියදම් තුළට සංග්‍රාම වියදම් ඇතුළත් කිරීම.
(2) බදු ක්‍රමය මගින් ප්‍රතික්‍රමික බදු හා රාජ්‍ය වියදම් තුළට සංග්‍රාම වියදම් ඇතුළත් කිරීම.
(3) බදු ක්‍රමය මගින් සමානුපාතික බදු හා රාජ්‍ය වියදම් තුළට සංග්‍රාම වියදම් ඇතුළත් කිරීම.
(4) බදු ක්‍රමය මගින් නිෂ්පාදනයන්ට සහනාධාර සැපයීම හා ඍජු බදු ඉවත් කිරීම.
(5) බදු ක්‍රමය මගින් ඍජු බදු වැඩිකිරීම හා වක්‍ර බදු ඉවත් කිරීම. (........)

(44) රජ්‍ය අයවැය 'හිඟය' පියවාගැනීමේ මාර්ගයක් වශයෙන් මුදල් සැපයුමට බලපෑමක් සිදු වන්නේ මින් කුමන මූලාශ්‍ර ක්‍රමයද?

(1) ජාතික ඉතිරිකිරීමේ බැංකුව (2) බැංකු නොවන මූල්‍ය ආයතන
(3) සේවක අර්ථ සාධක අරමුදල (4) මහ බැංකුව
(5) නිදන් අරමුදල් (........)

(45) මානව සංවර්ධන දර්ශකයේ සංරචකයක් වන්නේ මින් කවර සංරචකයද?

(1) උපතේදී ආයු අපේක්ෂාව (2) සාක්ෂරතාව
(3) ප්‍රාථමික අධ්‍යාපනය (4) වයස අවු. 1 දී ආයු අපේක්ෂාව
(5) ළදරු මරණ අනුපාතය (........)

(46) 2012 වර්ෂය වන විට ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකයේ, අගය හා ශ්‍රී ලංකාවේ තත්ත්වය නිවැරදිව ප්‍රකාශ වන්නේ,

(1) 0.715 හා 92 (2) 0.710 හා 92 (3) 0.0715 හා 90
(4) 0.725 හා 82 (5) 0.715 හා 82 (........)

(47) ශ්‍රී ලංකා ආර්ථිකයේ ශ්‍රමිකයන් විදේශ ගතවීමේ අනුපාතය ඉහළ යාම ආර්ථික වශයෙන් වැදගත් වී ඇත්තේ,

(1) ශ්‍රී ලංකාවේ ශ්‍රම සහභාගීත්ව අනුපාතය ඉහළ යාම.
(2) ශ්‍රී ලංකාවේ සේවා නියුක්ත කාන්තාවන් ඉහළ යාම.
(3) මැද පෙරදිග රටවල රැකියාවන් සඳහා යන ශ්‍රමිකයින් ඉහළයාම.
(4) ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ හිඟය අවම කිරීම.
(5) විදේශ රැකියා වෙළඳපල වර්ධනය වීම. (........)

The National e-learning Portal for The General Education

(48) ශ්‍රී ලංකාවේ 2012 ශ්‍රමබලකා සහභාගීත්ව අනුපාතය හා සේවා වියුක්ත අනුපාතය පිළිවෙළින් නිවැරදිව ප්‍රකාශ වන්නේ,

(1) 52.6 හා 4.0 (2) 47.8 හා 4.2 (3) 48.7 හා 5.8

(4) 52.6 හා 5.8 (5) 47.8 හා 4.0 (........)

(49) රජයක් රාජ්‍ය වියදම් තුළ "වර්තන සංග්‍රාම වියදම්" අඩුකළ විට ආර්ථිකය තුළ සිදුවිය හැකි අනිටු ප්‍රතිවිපාකයකි

(1) දරිද්‍රතාවයෙන් පෙළෙන ජන කොටස්වල ශුභ සාධනය ඉහළ යාම.

(2) දරිද්‍රතාවයෙන් පෙළෙන ජන කොටස්වල සමාජ ශුභ සාධනය අහිතකර වීම.

(3) විසර්ජන කෙටුම්පත ප්‍රතික්ෂේප වීම.

(4) දිළිඳු ජන කොටස් තම ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට පියවර ගැනීම.

(5) දිළිදු ජන කොටස් රජය කෙරේ අප්‍රසාදය එල කිරීම. (........)

(50) වෙළඳ අනුපාතය යහපත් විය හැක්කේ පහත සඳහන් කුමන අවස්ථාවකදී ද?

(1) ආනයන වටිනාකමට වඩා වැඩි වේගයකින් අපනයන වටිනාකම වැඩි වූ විටකදී ය.

(2) අපනයන වටිනාකමට වඩා වැඩි වේගයකින් ආනයන වටිනාකම වැඩි වූ විටකදී ය.

(3) විනිමය අනුපාතිකය අධිතක්සේරු වූ විටකදී ය.

(4) විනිමය අනුපාතිකය ක්ෂය වීමක් සිදු වූ විටකදී ය.

(5) ආනයන මිල දර්ශකය වැඩිවන වේගයට වඩා අඩු වේගයකින් අපනයන පරිමාව වැඩි වූ විටකදී ය.

(........)

The National e-learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved.



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# ආර්ථික විද්‍යාව - II

**13 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

- **"අ" "ආ" කොටස්වලින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

## "අ" කොටස

01. (1) නූතන ආර්තික විද්‍යාවට අනුව අසීමාන්තික නිෂ්පාදන සාධක 3 ක් නම් කරන්න. (ල. 04)

(2) ආර්ථික සම්පත් ලෙස භූමිය අර්ථ දක්වා භූමිය නමැති සාධකයේ දැකිය හැකි ලක්‍ෂණ පැහැදිලි කරන්න. (ල. 04)

(3) ඕනෑම ආර්ථිකයකට 'හිඟකම' පොදු ආර්ථික ප්‍රශ්නයක් ලෙස පැහැදිලි කරන්න. (ල. 04)

(4) නිෂ්පාදන සම්පත් පැහැදිලි කර උදාහරණ සපයන්න. (ල. 04)

(5) ඕනෑම සමාජයකට මූලික තේරීමේ ප්‍රශ්ණයකට මුහුණ දීමට සිදුවන්නේ කවර සාධක නිසාද? එම තේරීම් ප්‍රශ්න නම් කරන්න. (ල. 04)

02. (1) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ඇඳීමේදී යොදාගනු ලබන උපකල්පන කවරේද? (ල. 03)

(2) 'ආවස්ථික පිරිවැය' යන්න පැහැදිලි කර ආවස්ථික පිරිවැයක් හටගැනීමට හේතුවන සාධක නම් කරන්න. (ල. 04)

(3) වැඩෙන ආවස්ථික පිරිවැය පැහැදිලි කර ආවස්ථික පිරිවැය වැඩිවීමට හේතු වූ සාධක කවරේද යන්න දක්වන්න. (ල. 03)

(4) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මත පහත සඳහන් සිදුවීම් දක්වන්න. (ල. 2x5 = 10)

(i) ආර්ථික පසුබෑම

(ii) ආර්ථික පරිහානිය

(iii) සමස්ථ ශ්‍රම හමුදාවේ ඵලදායිතාව ඉහළ යාම.

(iv) අභ්‍යන්තර ගැටුමකින් කාර්මික අංශය විනාශ වීම.

(v) කෘෂි කර්මාන්තය සඳහා නව තාක්ෂණික උපකරණ හඳුන්වා දීම.

03. (1) නිෂ්පාදන ක්‍රියාවලියේදී ව්‍යවසායකයාගේ කාර්යය ඉතා වැදගත් වූවකි. ඔහුගේ කාර්යය කවරේද? (ල. 04)

(2) ප්‍රාග්ධනය හා ආයෝජනය අතර වෙනස කවරේද? (ල. 04)

(3) වෙළඳපල ආර්ථිකයක ලක්ෂණ නම් කරන්න. (ල. 04)

(4) වෙළඳපල ආර්ථිකයක ලක්ෂණ ඉටුකරන කාර්යන් මොනවාද? (ල. 04)

(5) වෙළඳපල ආර්ථිකයක රජයට කාර්ය භාරයක් පවතීද? එසේ නම් ඒ මොනවාද? (ල. 04)

04. (1) කතිපයාධිකාරී වෙළඳපලක ලක්ෂණ කවරේද? (ල. 04)

(2) පූර්ණ තරගකාරී වෙළඳපලක් 'මිළ ගනුදෙනුකරුවෙකු' ලෙස කටයුතු කරයි. පැහැදිලි කරන්න. (ල. 04)

(3) පූර්ණ තරගකාරී වෙළඳපලක බඩ ඉරිගු සඳහා ඉල්ලුම් හා සැපයුම් සමීකරණය පහත දැක්වේ.

$$Qd = 70 - 4P \qquad Qs = -20 + 6P$$

(අ) බඩ ඉරිඟු සඳහා වෙළඳපල සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න. (ල. 04)

(ආ) සමතුලිත මිලේදී මිල ඉල්ලුම් නම්‍යතාවය ගණනය කරන්න. (ල. 04)

(ඉ) රජය බඩ ඉරිඟු සඳහා රු. 12.00 ක සහතික මිලක් ලබාදීමට තීරණය කරන ලදී. සහතික මිල යටතේ රජයට දැරීමට සිදුවන වියදම කොපමණද? (ල. 02)

(ඊ) සහතික මිල පැනවීමෙන් පසු වෙළඳපල මිල කොපමණද? (ල. 02)

(උ) සහතික මිලෙන් පසුව රජයට ඌණපූර්ණ ගෙවීම් වශයෙන් දැරීමට සිදුවන වියදම ගණනය කරන්න. (ල. 02)

(ඌ) සහතික මිලෙන් පසු පාරිභෝගික අතිරික්තයේ හටගන්නා වෙනස කොපමණද? (ල. 04)

05. (1) සරල ආර්ථිකයක ජාතික ආදායමේ සමතුලිතය ලියා දක්වන්න. (ල. 04)

(2) ආවෘත්ත ආර්ථිකයකට රජය ඇතුළත්වීමෙන් පසු ආර්ථිකය තුළ සිදුවන වෙනස්වීම් මොනවාද? රජය මැදිහත්වීමෙන් පසු සමතුලිතය ලියා දක්වන්න. (ල. 04)

(3) විවෘත ආර්ථිකයක සාර්ව ආර්ථික දත්ත පහත දැක්වේ.

| | | |
|---|---|---|
| අයවැය ශේෂය | රු.මි. - | 250 |
| පරිභෝජන වියදම | රු.මි. - | 4,200 |
| ජාතික ආදායම | රු.මි. - | 6,200 |
| රජයේ මිලදී ගැනීම් | රු.මි. - | 700 |
| ආනයන | රු.මි. - | 860 |
| අපනයන | රු.මි. - | 240 |

(i) රාජ්‍ය බදු ආදායම ගණනය කරන්න. (ල. 04)

(ii) වැයකළ හැකි ආදායම කොපමණද? (ල. 04)

(iii) ආයෝජන අගය ගණනය කරන්න. (ල. 04)

(iv) ඉතිරිකිරීම් වල අගය ගණනය කරන්න. (ල. 04)

"ආ" කොටස

06. (1) බැංකු පොළී අනුපාතය හා වත්කම් ලෙස මුදලට ඇති ඉල්ලුම අතර ඇති සම්බන්ධතාවය විමසන්න. (ල. 03)

(2) වාණිජ බැකංුවක මුදල් මැවීමේ ක්‍රියාවලිය සිදුවීමට බැංකු පද්ධතියක් තුළ පැවතිය යුතු මූලික අවශ්‍යතා මොනවාද? (ල. 03)

(3) වාණිජ බැංකුවක මුදල් මැවීමේ හැකියාව සීමා කරන සාධක 04 ක් ලියන්න. (ල. 03)

(4) කල්පිත ආර්ථිකයක පවත්නා වාණිජ බැංකුවක ශේෂ පත්‍රය ඔබට සපයා ඇත. ඒ ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| ඉ/තැන්පතු | 2500 | කාසි සංචිතය | 1500 |
| | | ණය | 1000 |
| | 2500 | | 2500 |

(i) මහ බැංකුව විසින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 20% ලෙස ප්‍රකාශයට පත්කරන ලදී. වාණිජ බැංකුව සතු අධි සංචිත පවතීද? එසේ නම් ප්‍රමාණය කොපමණද? (ල. 03)

(ii) සංචිත පවතින්නේ නම් සැපයිය හැකි ණය ප්‍රමාණය හා මැවිය හැකි ණය කොපමණද? (ල. 03)

(iii) ණය දීමෙන් පසු බැංකුවේ නව ශේෂපත්‍රය සකස් කරන්න. (ල. 03)

(iv) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 5% දක්වා අඩුකළේ නම් ණය මැවිය හැකි ප්‍රසාරණ සංගුණකය කීයද? (ල. 02)

07. (1) රජය බදු ආදායමේ බදු නොවන ආදායම් මුලාශ්‍ර නම් කරන්න. (ල. 05)

(2) රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන උපකරණ නම් කරන්න. (ල. 05)

(3) ඕනෑම ආර්ථිකයක් ඉටුකරගැනීමට අපේක්ෂිත සාර්ව ආර්ථික අරමුණු මොනවාද? (ල. 05)

(4) රාජ්‍ය අයවැය ලේඛනයක 'හිඟය' පියවා ගැනීමේදී ආර්ථිකයේ උද්ධමන ප්‍රතිවිපාක ඇති විය හැකි මූලාශ්‍ර මොනවාද? (ල. 05)

(5) අයවැය ලේඛනයේ 'වර්තන ගිණුම' ඉතා වැදගත් වූවකි. එම ගිණුමේ අතිරික්තයක් පැවතීමෙන් ආර්ථිකයකට අත්විය හැකි හිතකර ප්‍රතිඵල කවරේද? (ල. 05)

08. (1) රාජ්‍ය ණය අර්ථ දක්වා ශ්‍රී ලංකා රාජ්‍ය ණයෙහි මෑතකාලීන උපනතීන් පැහැදිලි කරන්න. (ල. 02)

(2) අන්තර් ජාතික වෙළඳාමේදී 'ආරක්ෂණවාදී ප්‍රතිපත්ති' යන්න හඳුන්වන්න. (ල. 04)

(3) ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අහිතකර ප්‍රතිඵල කවරේද? (ල. 04)

(4) විදේශ වෙළඳාමේ කටයුතු වල යෙදීසිටින A සහ B රටවල් දෙකට අදාළ යෙදවුම් ඒකකයක නිමවුම පහත දැක්වේ. (Kg)

| | A | B |
|---|---|---|
| සීනි | 70 | 30 |
| පිටි | 90 | 60 |

(අ) සීනි සහ පිටි නිෂ්පාදනය සම්බන්ධව නිරපේක්ෂ වාසි ඇත්තේ කුමන රටවලටද? (ල. 02)

(ආ) විදේශ වෙළඳාමේ ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා විදේශ වෙළඳාමේ යෙදීමට මෙම භාණ්ඩ දෙක සම්බන්ධයෙන් සාපේක්ෂ වාසි ඇති රට කුමක්ද? (ල. 04)

(ඇ) භාණ්ඩ දෙක සම්බන්ධව අභ්‍යන්තර හුවමාරු වාසිය අගයන්න. (ල. 02)

(ඈ) මෙම භාණ්ඩ දෙක සම්බන්ධව ජාත්‍යන්තර හුවමාරු අනුපාතය ගණන කරන්න. (ල. 02)

09. (1) ආර්ථික වෘද්ධියේ ප්‍රතිලාභ කවරේද? (ල. 05)

(2) ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය යන සංකල්ප දෙක පැහැදිලි කරන්න. (ල. 05)

(3) ආර්ථික සංවර්ධනයකදී වැදගත්වන්නේ 'තිරසාර සංවර්ධනයක්' අත්පත්කර ගැනීම බව ආර්ථික විද්‍යාඥයින් පවසයි. තිරසාර සංවර්ධනය වශයෙන් ඔබ හඳුනාගන්නේ කුමක්ද? තිරසාර සංවර්ධනයන්ට අවශ්‍ය කොන්දේසි කවරේද? (ල. 05)

(4) මානව සංවර්ධන දර්ශකයේ ඇතුලත් සංරචක මොනවාද? (ල. 05)

10. (1) ග්‍රාමීය ප්‍රදේශවල 'දරිද්‍රතාවයට' හේතු වශයෙන් හඳුනාගෙන ඇති සාධක කවරේද? (ල. 05)

(2) දිළිඳු ජන කොටස්වලට හිතකරවූ වෘද්ධියක් අත්පත් කරදීම සඳහා රජය මෑතකාලීනව ක්‍රියාවට නංවන ලද ක්‍රියාමාර්ග දක්වන්න. (ල. 05)

(3) ජනගහනය රටකට සම්පතකි. ආර්ථික වශයෙන් රටක අක්‍රිය ජන සංඛ්‍යාව වැඩිවීම එරටේ ආර්ථික වෘද්ධියට බලපෑමක් සිදුකළ හැකිද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ල. 05)

(4) සේවා නියුක්තියේ ප්‍රධාන කොටස් වර්ගකර ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ සිදු වූ මෑත කාලීන ප්‍රබල වෙනස්වීම් මොනවාද යන්න පැහැදිලි කරන්න. (ල. 05)